යටියන්තොට ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 23 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.907,085 ක් වූ වත්කම් හා රු.675,592 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබුණු රු.35,060 ක වට්ටම ලැබුණු වට්ටම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී රු.60,505 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමට ඇතුළත් විමේ වරද නිවැරදි කිරීමට ප්‍රාග්ධනයෙන් ආදායමට දායකවීමේ ගිණුම හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම නිවැරදි කර තිබියදී නැවත එම ප්‍රමාණය පොදු ගබඩා ගිණුම හා අවිනිශ්චිත ගිණුමට ගලපා තිබුණි.

(ඈ) 2013, 2014 හා 2015 වර්ෂ වලට අදාලව ගෙවූ රු. 514,185 ක් වූ උසාවි දඩ කාර්යමණ්ඩල දිරිදීමනා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2014 හා 2015 වර්ෂවලට අදාලව ගෙවූ මුද්දර ගාස්තු සටහන් කිරීමේ ගාස්තු රු.65,050 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ස්ථාවර තැන්පත් ගිණුම් 02 කට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු පොලී ආදායම රු.179,356 ක් වුවත් එය රු.149,397 ක් ලෙස දැක්වීම නිසා රු.29,959 කින් පොලී ආදායම් හා ආදායම් ණයගැතියෝ අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ඉදිකිරීම සඳහා ලැබී තිබුණු රු.23,339,349 ක් වූ පළාත් සභා හා රේඛීය අමාත්‍යාංශ ආධාර හා එම කර්මාන්ත වෙනුවෙන් වැය කරන ලද රු.21,712,502 ක් වූ වියදම් , ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා සත්‍ය මුද්දර ගාස්තු ආදායම තහවුරුකර ගැනීමෙන් තොරව රු.5,800,000 ක් ආදායම් වියදම් ගිණුමේ ආදායම් ලෙස දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ආධාර රු.328,220 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) භෞතික පැවැත්මක් නොමැති ලෙස හඳුනාගෙන තිබුණු සභාවට අයත් රු.969,054 ක් වටිනා ගොඩනැගිලි 18 ක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් යටතේ දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂය අතර රු.10,219,879 ක වෙනසක් දක්නට ලැබුණි.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

--------------------

ඉකුත් වර්ෂවල හඳුනා නොගත් රු.3,061,151 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලින් කපාහැර තිබුණි.

1.3.4 <u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට හාකළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේමුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.396 (ඇ) | ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.39,617 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ.570, 571 | 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 45 කදී තැන්පත් කරන ලද එකතුව රු.1,099,442 ක් වූ විවිධ තැන්පත් හා 1973 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ දී අවස්ථා 276 කදී තැන්පත් කරන ලද එකතුව රු.66,205 ක් වූ ගෙවල් කුලී තැන්පත් පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණු අතර ඒවා ප්‍රාදේශීය සභා අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මු.රෙ.1646 | වාහන ධාවන සටහන් ගමනේ යෙදුන මාසයට පසු මාසයේ 15 වන දිනට පෙර මාසික සාරාංශ සමඟ විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවත් සභාවේ කිසිදු වාහනයකට අදාලව එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය | දුරකථන කුළුණු / ඇන්ටනා කුළුණු ඉදිකිරීමේදී කුළුණේ උස මීටර් 05 ත් 20 ත් අතර රු.20,000 ක් හා වැඩිවන සෑම මීටරයක් සඳහාම රු.100 බැගින් පෙරසැරි ගාස්තු අයකල යුතු වුවත් මධ්‍යම පරිසර අධිකාරියේ දත්ත අනුව කුළුණු 08 ක් සඳහා රු.166,500 ක් වූ ගාස්තු අයකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශලේකම් ගේ 2010 නොවැම්බර් 16 දිනැති අංක සීඑම්/ඒඩී/20/03 දරන චක්‍රලේඛය | කණිෂ්ඨ සේවකයන් වශයෙන් පත්වීම් ලබාතිබුණු සේවකයින් 10 දෙනෙකු පත්වීම් ලබාදී තිබුණු තනතුරෙහි නොයොදවා වෙනත් කාර්යයන්හි යොදවා තිබුණි. |
| (ඇ) | අංක 2009/01 හා 2009 මාර්තු 09 දිනැති සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේචක්‍රලේඛය 1.5 ඡේදය | 2009 වර්ෂය සඳහා බදුකුලිය තක්සේරු කර එය 2011 වර්ෂයේ සිට අයකර තිබුණු අතර එකී තක්සේරුව ඉදිරි වර්ෂ 3 ක් සඳහා පමණක් වලංගු වන බව දක්වා තිබුණද 2016 වර්ෂය වෙනුවෙන්ද එකී තක්සේරුවමත පොදු වෙළදපල කඩකාමර බදුකුලී අයකර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 1,910,095 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.2,116,635 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.206,540 ක පසුබෑමක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 206,540 ක පසුබෑමට ආදායම් විෂයයන් 02 ක අඩුවීම හා වියදම් විෂයයන් 05 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබද තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනටහිඟය | 2016.12.31 දිනට හිඟයෙන්අය කිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2016.12.31දිනට හිඟය<br>2016.01. 01 දිනට පැවති හිඟයෙන් හිග | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000’ | රු.000’ | රු.000’ | රු.000’ | රු.000’ | රු.000’ | රු.000’ |
| (i) වරිපනම් හා බදු | 2,145 | 1,469 | 3,686 | 3,125 | 676 | 561 | 1,237 |
| (ii) බදු කුලී | 788 | 281 | 4,806 | 4,294 | 507 | 512 | 1,019 |
| (iii)වරෙන්තු ගාස්තු හා දඩ | 13,683 | 13,683 | 5,333 | - | - | 5,333 | 5,333 |
| (iv) වෙනත්ආදායම් | 15,686 | 13,388 | 26,436 | 18,243 | 2,298 | 8,193 | 10,491 |
| එකතුව | 32,302 | 28,821 | 40,261 | 25,662 | 3,481 | 14,599 | 18,080 |

2.3.2 වරිපනම්

යම් වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට එම බද්ද අයවීමට ඇති ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන විකිණීමෙන් හෝ මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු වුවද නියැදි පරීක්ෂණය අනුව ඉඩම් හිමියන් හා වරිපනම් / අක්කර බදු ස්ථාන 47 කින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයනොවූ රු.121,879 ක වරිපනම් හා අක්කර බදු අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

2.3.3 බදු කුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ග අඩි 136 ක් පමණ විශාලත්වයෙන් යුතු බස්නැවතුම්පල කඩ කාමර 12 කින් කඩකාමර 10 ක් රු.3,000 බැගින් හා කාමර 02 ක් රු.1,900 බැගින් මාසික කුලියකට බදු දී තිබුණු අතර 2013 දෙසැම්බර් 23 සිදුවූ හදිසි ගින්නෙන් පසුව කඩ කාමර පැවති තත්ත්වයට වඩා හොඳ තත්ත්වයක් ලැබෙන ලෙස අළුත්වැඩියා කර තිබුණි. එසේ වුවද 2009 දෙසැම්බර් 08 දින සිදු කළ තක්සේරුව මත බදුකුලී අයකර තිබුණු අතර 2012 වර්ෂයෙන් පසුව වාර්ෂිකව බදු ගිවිසුම් අළුත්කර නොතිබුණි.

(ආ) පොදු වෙළඳපොලෙහි වර්ග අඩි 240 ක් පමණ වූ කඩ කාමරයක් 2015 ජනවාරි සිට 2017 ජනවාරි දක්වා නිශ්කාර්යව තිබුණු අතර එම කාමරය කොම්පෝස්ට් පොහොර අලෙවිය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණද පොහොර අලෙවිය සභා පරිශ්‍රයේම සිදු කර තිබුණු බැවින් වර්ෂ 02 ක සිට කඩකාමර කුලිය සභාවට අහිමිවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් හා පරිපූරක ඇස්තමේන්තු දෙකකින් මහජන සුභසාධනයට අවශ්‍ය කටයුතු කිරීම සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙසරු.59,596,829 ක් වෙන්කරගෙන තිබුණි. එම ප්‍රතිපාදනයෙන් දේශීය ණය සංවර්ධන අරමුදලේ ගණුදෙනු සඳහා වෙන්කල රු.1,489,455 ක් අඩුකළ විට සභා කටයුතු සඳහා වැය කලහැකි මුදල රු.58,107,374 ක් විය.මුල්‍ය ප්‍රකාශන අනුව සභාව විසින් පුනරාවර්තන වියදම් සඳහා රු.42,963,748 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.2,138,284 ක් ලෙස එකතුව රු.45,102,032 ක් සත්‍ය වශයෙන් වියදම් කර තිබුණු බැවින් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.13,005,342 ක් හෙවත් සියයට 22.4 ක් සභා කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) මහජන සුභ සිද්ධිය සඳහා සෘජුව බලපාන වැය විෂයයන් 08 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් සියයට 43 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරි කිරීම්තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දින සිට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබා තිබුණු සේවකයින් 10 දෙනෙකු වෙනුවෙන් 2016 ජනවාරි, පෙබරවාරි මාසවලට අදාලව පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවන ලද රු. 64,950 ක් හා රු. 16,238 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. මීට අමතරව මෙකී කාලයට අදාලව වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක මුදල් වශයෙන් රු. 18,789 ක් සේවකයන්ගේ වැටුපෙන් අඩුකර යවා නොතිබුණි.

(ආ) යටියන්තොට නගරයේ පර්චස් 7.5 ක් වූ භූමි කොටස බදුදීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) උක්ත බිම් කොටස 1981 වර්ෂයේ සිට වාර්ෂික බදු පදනම මත ඛනිජතෙල් නීතිගත සංස්ථාවට බදු දී තිබුණ අතර අවසන්වරට 2001 ඔක්තෝබර් 15 දින ආරම්භ වී 2011 ඔක්තෝබර් 14 දිනෙන් අවසන් වීමේ පදනම මත ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසු දෙපාර්ශවයේ එකඟතාවය මත නැවත වර්ෂ 10 ක් සඳහා ගිවිසුමකට එළඹියහැකි වුවද 2017 ජනවාරි 06 දින වන විටත් නව ගිවිසුමකට එළඹීමෙන් තොරව භූමිය පරිහරණය කරමින් පැවතුණි.

(ii) බදු ගිවිසුමේ 6 වන වගන්තිය අනුව වර්ෂ 05 කට වරක් ප්‍රධාන තක්සේරුකරු ලවා තක්සේරුකර එකී තක්සේරු මුදල මෙන් සියයට 150 ක බදු කුලියක් අය කලයුතු වුවත් ගිවිසුම ආරම්භ කල 2001 වර්ෂයෙන් පසුව වසර 15 ක් තුල නැවත තක්සේරු කර නොතිබුණි.

(iii) නව තක්සේරුවක් සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් ඉල්ලීමක් කර තිබුණද අදාල ඉඩම පිළිබඳ ඔප්පු හා නිවැරදි පිඹුරුපතක් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් තක්සේරු වාර්තා ලබාදී නොමැති බව අනාවරණය වූ අතර අදාල ලිපි ලේඛන ලබාදී නව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට 2017 ජනවාරි 06 දින වනවිටත් සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) 1985 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව පුද්ගලයන් 48 දෙනෙකුට දෙනලද එකතුව රු.625,550 ක් වූ සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ මංමාවත් හා පදික වේදිකා අළුත්වැඩියා හා නඩත්තු වැය විෂය යටතේ පොදු අරමුදල් ප්‍රතිපාදන මත මාර්ග 18 ක් සංවර්ධනය කිරීමට ප්‍රතිපාදන වෙන්කර තිබුණි. සැළසුම් අංශයේ වාර්තා අනුව, අයවැය ලේඛනයේ ඇතුළත් මංමාවත් හැර වෙනත් මංමාවත් 19 ක් සංවර්ධනය කිරීම සඳහා එකතුව රු. 7,219,488 ක ඇස්තමේන්තු අනුමත කර ගෙන තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වනවිට රු.5,126,997 ක වියදම් දරා තිබුණි. එම කර්මාන්ත 19 න් රු.873,066 ක් වටිනා කර්මාන්ත 3 ක් ආරම්භ කර නොතිබුණු අතර ඉතිරි කර්මාන්ත සඳහා වැය කරන ලද මුදල රු.1,706,997 කින් ප්‍රතිපාදන මුදල ඉක්මවා වියදම් දරා තිබුණි. එසේ වුවද අයවැය ලේඛනයේ යෝජිත අත්‍යවශ්‍ය අළුත්වැඩියාවක් වූ කලටුවාව ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයට යන මාර්ගය සංවර්ධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහජන පුස්තකාලය සඳහා වෙන්කර තිබූ ගොඩනැගිල්ල වසර කිහිපයකට පෙර අබලන්වීම හේතුවෙන්, 2006 වර්ෂයේ ඉදිකල දෙමහල් ගොඩනැගිල්ලේ රැස්වීම් ශාලාවේ තාවකාලිකව පුස්තකාලය ස්ථාපිත කර 2017 ජනවාරි 05 දින දක්වාම පවත්වාගෙන යමින් තිබුණි. මේ හේතුවෙන් රැස්වීම් ශාලාව කුලියට දීමෙන් ලබාගතහැකි ආදායම් සභාවට අහිමිවී තිබුණ අතර සභා කටයුතු සඳහා රැස්වීම්ශාලාව යොදා ගැනීමට නොහැකිවී තිබුණි.

3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

වාහන 07 ක් වර්ෂ 03 සිට 08 දක්වා කාලයක සිට නිෂ්කාර්යව පැවති අතර එම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 හඳුනාගත් අලාභ

2010 හා 2011 වර්ෂ වලදී කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියේ කාර්යාලය සහ ගබඩාව ඉදිකිරීම සඳහා පලමු අදියර යටතේ රු.536,520 ක් ගෙවීම් කර තිබුණද 2017 ජනවාරි 05 දින විගණන පරික්ෂාවට අනුව එවැනි ඉදිකිරීමක් සිදුකර නොතිබූ බව අනාවරණය විය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

දොරින් දොරට ගමින් ගමට ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම යටතේ පරුස්සැල්ල ඩී.එම්. ද සිල්වා මාවතේ පාලම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2014 නොවැම්බර් 21 දින රු.1,448,273 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2017 ජනවාරි වනවිට මෙම කර්මාන්තය සඳහා අරමුදල් ප්‍රභවයන් තුනක් යටතේ රු.767,861 ක් වැය කර තිබුණද පාලමේ තට්ටුව දමා නොතිබුණු අතර ගලවා ඉවත් කරනලද කොන්ක්‍රීට් විදුලි කණු යොදා අනාරක්ෂිතව භාවිතයට ගැනීම සිදුකරමින් පැවතිණි.

3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
--------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 වර්ෂයේ සිට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණු අතර මෙම ව්‍යාපෘතිය තවදුරටත් සාර්ථකව ඉදිරියට ගෙනයාම සඳහා බාධාකාරිවන පහත සඳහන් ගැටළු නිරාකරණය කරගෙන නොතිබුණි.

(i) නොදිරන ද්‍රව්‍ය අලෙවි කිරීමට පෙර ගබඩාකිරීම සඳහා ගබඩා පහසුකම් හා ප්‍රතිචක්‍රීයකරණයට හෝ අපහරණයට පහසුකම් නොමැති වීම.

(ii) ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ගැණුම්කරුවන් සොයාගැනීම

(iii) ස්ථිර ජල පහසුකම් හා ඉඩ පහසුකම් නොමැතිවීම.

(iv) සේවක සුභසාධනය හා අවශ්‍ය යාන්ත්‍රික උපකරණ ප්‍රමාණවත් නොවීම.

(ආ) පොලිතීන් සහ ප්ලාස්ටික් වැනි නොදිරන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය සඳහා ක්‍රමවේද සොයාබලා නොතිබුණි.

(ඇ) කොම්පෝස්ට් පොහොර සැකසීමෙන් පසු ඉතිරිවන කසල ගොඩගසන ස්ථානය ආවරණය වන ලෙස පැති බැම්මක් නොමැති නිසා පරිශ්‍රයෙන් බැහැර ඉඩම් වලට කසල ගලා යාහැකි බැවින් අමතර පාරිසරික ප්‍රශ්න පැන නැගීමට ඇති හැකියාව වර්ධනය වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් වැය විෂයයන් 10 ක එකතුව වූ රු.2,724,500 ක ප්‍රතිපාදන සියයට 100 ක් ද, වැය විෂයයන් 23 ක ප්‍රතිපාදන එකතුව වූ රු.33,686,690 කින් සියයට 14 සිට සියයට 94 දක්වා ප්‍රමාණයන්ගෙන් එකතුව රු.11,064,179 ක ප්‍රතිපාදන සභා කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණ අතර වැය විෂයයන් 04 ක වෙන්කල ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.1,803,283 ක් වැය කර තිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) අවිනිශ්චිත ගිණුම නිරවුල් නොකිරීම |
| | | (ii) කල් ඉකුත් තැන්පත් ආදායමට නොගැනීම |
| | | (iii) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (iv) ජර්නල් සටහන් සඳහා පැහැදිලි සංලක්ෂය ඉදිරිපත් නොකිරීම |
| | | (v) ආදායම් , වියදම් හා වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම |
| | | (vi) ලෙජර් ගිණුම් ශේෂ හා ලේඛන නොසැසඳීම |
| (ආ) | අයවැය පාලනය | ශුද්ධ ප්‍රතිපාදනයෙන් සැලකියයුතු ප්‍රමාණයන්ගෙන් ප්‍රතිපාදන ඉතිරි කර තිබීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) හිග ආදායම් අයකර නොගැනීම |
| | | (ii) බදුකුලී නිසි කලට තක්සේරු කර නොගැනීම |
| (ඈ) | වාහන පාලනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | | (ii) වාහන ලොග් පොත් යාවත්කාලීන නොකිරීම |
| | | (iii) ගර්හිත හා අළුත්වැඩියා කළයුතු වාහන සම්බන්ධයෙන් කටයුතු නොකිරීම |
| (ඉ) | මුල්‍ය පාලනය | (i) අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම |
| | | (ii) කල් ඉකුත් චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම |